පුබුදින පස්පියුම - 2020

කලාප අධ්‍යාපන කාර්යාලය - මහනුවර
සිසු නිපුණතා සාධන අනාවරණ පරීක්ෂණය
මව්බස

නම :- ..................................................

පාසල :- ..................................................

1) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අපි රෝද පාර දිගේ වනය තුළට රිංගුවෙමු. තොරතෝංචියක් නැති ව නැඟෙන කුරුලු ගීතයෙන් නිහැඬියාව මැකී යයි. මිනිස් කටහඬක් අසන්නට නැති බැවින් කුරුලු ගීතය වුව ද සිත සලිත කරවීමේ බලයක් ලබා ඇත. ගස් දෙකක් එකට ඇතිල්ලී නැඟෙන ක්‍රීං.... ක්‍රීං.... නාදය ගස් අතරින් රිංගා ඈතට ම දිව යයි. අත්තෙන් අත්තට පනින රිළා වඳුරු සේනාව අප දෙස බලා සිටින්නේ අප බිය ගන්වන විලාසයකිනි. කන් බිහිරි කරවන රැහැයි නාදය වන ගැබේ පාළුවට තර්ජනයක් වුව ද සිත තුළ රජයන පාළුව බිය මුසු හැඟුම් ජනනය කරවයි.

1. රෝද පාර දිගේ ගියේ කොහාට ද?

..........................................................................................................

2. නිහැඬියාව මැකී යන්නේ කුමකින් ද?

..........................................................................................................

3. අසන්නට නොමැති යැයි සඳහන් ව ඇත්තේ කුමන හඬ ද?

..........................................................................................................

4. බිය ගන්වන විලාසයකින් බලා සිටින්නේ කවුරුන් ද?

..........................................................................................................

5. වන ගැබේ පාළුවට තර්ජනයක් වූයේ කුමක් ද?

..........................................................................................................

6. ක්‍රීං.... ක්‍රීං.... නාදයක් නිකුත් වන්නේ කෙලෙස ද?

..........................................................................................................

7. සිත සලිත කිරීමේ බලයක් ඇත්තේ කුමකට ද?

..........................................................................................................

8. බිය මුසු හැඟීම් ඇති වන්නේ කුමක් නිසා ද?

..........................................................................................................

9. මෙහි සඳහන් උත්තම පුරුෂ බහුවචන ආඛ්‍යාත පදයක් සොයා ලියන්න.

..........................................................................................................

10. කැලය යන්නට සමාන පදයක් තෝරා ලියන්න.

..........................................................................................................



Scanned with CamScanner

2) නිවැරදි අකුර යොදා හිස්තැන් පුරවන්න.

1. කා ල ........ ට හ න (ශ / ස)
2. පෞ රු ........ ය (ශ / ෂ)
3. ජී වි තා ද ර් ........ ය (ෂ / ශ)
4. අ භ්‍යා ........ ය (ශ / ස)
5. ........ ඩ් ද ය (ෂ / ශ)
6. තා ක් ........ ණ ය (ශ / ෂ)

3) පහත සඳහන් පිල්ලම් සහිත වචන දෙක බැගින් ලියන්න.

1. කෙටි ඉස්පිල්ල .......................................... ..........................................
2. කෙටි කොන් පාපිල්ල .......................................... ..........................................
3. ඇලපිල්ල .......................................... ..........................................
4. ගැට ඇලපිල්ල .......................................... ..........................................
5. කොම්බුව සහිත හල්කිරීමේ ලකුණ .......................................... ..........................................

4) පහත සඳහන් වාක්‍යවල සුදුසු තැන්වලට විරාම ලකුණු යොදන්න.

1. මගේ පුතාගේ අතේ ඇඟිලි කීය ද
2. නෑ මගේ පුතේ මෙන්න මෙයයි ලොක්කා
3. සතියේ දවස් පහ ම පාසල් යන අත්තම්මලා සිටිති
4. ඔල්සත් කොහේ ද කියා ඇහුවේ මමයි
5. හොඳයි දැන් ඇඟිලි දිග අරින්නකෝ මහපටැඟිල්ලේ තුඩ අනෙක් ඇඟිලිවල තුඩට තියන්නකෝ

5) පහත සඳහන් කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

පෙරදිග ලෝකයේ බබලන මුතු ඇට ය
පණ ඇති මහා සමුදුරු පවුරෙන් වට ය
හෙළ දිවයින මගෙයි මා ඉපදුණ රට ය
ලොව අන් සියලු දිවයින් මේකට යට ය

1. පවුරක් සේ තිබෙන්නේ කුමක් ද?

..........................................................................................................



Scanned with CamScanner

2. 'මගේ රට' හඳුන්වා ඇත්තේ කුමන් ලෙසින් ද ? ........................................................................................................

3. ලෝකයේ අන් රටවලට වඩා මගේ රට ඉහළ ය' යන අදහස දී ඇති කවි පේළිය ලියන්න.

........................................................................................................................................................

6) හිස්තැනට ගැළපෙන වාක්‍යය වරහන් තුළින් තෝරා ලියන්න.

1. අද කළ යුතු දේ හෙටට කල් නොදමන්න.

........................................................................................................................................................

2. ඇඟිල්ලේ තරමට ඉදිමෙන්න.

........................................................................................................................................................

3. පනින් පෙර සිතා බලනු.

........................................................................................................................................................

4. ඇවිලෙන ගින්නට පිදුරු නොදමන්න.

........................................................................................................................................................

5. උගත මනා ශිල්පය ම යි මතු රැකෙනා.

........................................................................................................................................................

(ප්‍රමාණයට වඩා අහංකාර නොවන්න / වැඩ කල් නොදමන්න / යමක් කිරීමට පෙර සිතා බලන්න / උගත් දේ සැමදා රැකෙයි / ආරවුලක් තව තවත් ඇවිස්සීම නොකරන්න)

7) නිවැරදි අතීත කාල ක්‍රියා පදය වරහන් තුළින් තෝරා ලියන්න.

1. ඔහු අභ්‍යාවකාශ මධ්‍යස්ථානයේ සේවය ................................ (කළේ ය / කළෝ ය)

2. අයියා ගෙදර එන විට කේක් ගෙන ................................ (ආවෝ ය / ආවේ ය)

3. ඔවුහු කෙතට බැස ගොයම් ................................ (කැපුවේ ය / කැපුවෝ ය)

4. අපි ග්‍රහලෝකාගාරය නැරඹීමට ................................ (ගියෙමි / ගියෙමු)

5. ගුරුවරු ළමයින්ට නිවැරදි උපදෙස් ලබා ................................ (දුන්නේ ය / දුන්නෝ ය)



Scanned with CamScanner

8) හිස්තැනට ගැළපෙන උපමාව වරහන් තුළින් තෝරා පහත කවි සම්පූර්ණ කරන්න.

( රෝස මලක් සේ ම පෙනෙයි / අම්මාගේ මුහුණ වගෙයි / මුතු සේ දත් පෙළ දිලිසේ / කහමල් වත්තක් වාගෙයි )

1. රෑ අහසේ සඳ බබළයි

(i) ....................................................................

රෑ අහසේ තරු දිදුලයි

(ii) ....................................................................

2. අක්කාගේ සිනා මුහුණ

(i) ....................................................................

නංගිගේ සිනා කටේ

(ii) ....................................................................

9) පහත සඳහන් වචන යොදා ලිඛිත බසින් වාක්‍ය සාදන්න.

1. අහස - ....................................................................
2. විශාල - ....................................................................
3. කීකරු - ....................................................................
4. ගුරුවරු- ....................................................................
5. පරිගණකය - ....................................................................

10) 'මම පුවත්පතක් වෙමි' යන මාතෘකාවට අදාළව වාක්‍ය පහක් ලියන්න.

....................................................................

....................................................................

....................................................................

....................................................................

....................................................................



Scanned with CamScanner